දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } .........................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாயா'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/03/38/01/62/01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

දිනය / திகதி / Date } 2006-09-14

චක්‍රලේඛ අංක :- 2006/33

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

අතිරේක ලේකම්වරුන්

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)

සභාපති (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම)

ප්‍රධාන කොමසාරිස් (විද්‍යා පීඨ හා ගුරු අධ්‍යාපන පරිපාලන)

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්

සියලු ම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්

සියලු ම ජාතික පාසල් විදුහල්පතිවරුන්

සියලු ම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන්

ය්යලු ම කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන්

සියලු ම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරුවන්

සියලු ම පරිගණක සම්පත් මධ්‍යස්ථාන කළමනාකරුවන්

## සැමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

01. අරමුණ

සීඝ්‍රයෙන් වෙනස්වන නව දැනුම, පාසල් ප්‍රජාව වෙත ලබාදීමේ අරමුණෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ද පාසල් විෂය මාලාව තුළ මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සතියක් ප්‍රකාශයට පත් කර ඇති අතර එය 2006 වසරේ ඔක්තෝම්බර් මස 09 සිට 15 දින දක්වා ක්‍රියාත්මක වේ. මීට සමගාමී ව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ උපදෙස් හා මග පෙන්වීම මත අදාළ සතිය පාසල්වල ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණ වේ. මෙම සතිය තුළ දී අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාල, පාසල්, විශ්ව විද්‍යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, පරිගණක සම්පත් මධ්‍යස්ථාන (CRC), පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන (PICT) හා ජාතික අධ්‍යාපන ආයතනය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉටු කළ යුතු උපදෙස් සැපයීම හා මග පෙන්වීම මෙම චක්‍රලේඛය මඟින් බලාපොරොත්තු වේ.

## 02. වැඩ සටහන් සැකසීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආධ්‍යාපනික මෙවලමක් ලෙස භාවිතා කිරීම සඳහා පාසල් පද්ධතිය හා ප්‍රජාව උනන්දු කරවීම මෙම වැඩසටහන් මගින් බලාපොරොත්තු වේ. අදාළ සතිය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අධ්‍යාපන ආයතනයෙහි ප්‍රධානීන්, ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලයෙහි පූර්ණ වගකීම වනු ඇත. එහෙයින් අධීක්ෂණය හා උපදෙස් දීම සඳහා අදාළ ආයතනයේ ප්‍රධානියාගේ සභාපතීත්වයෙන්, ගුරුවරුන්, ශිෂ්‍ය නායකයින්, දෙමව්පියන් හා කාර්ය මණ්ඩල ඇතුළත් වන සේ මණ්ඩලයක් පත් කරගත යුතු ය.

පොදුවේ වැඩසටහන් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම සඳහා පළාත් හා කලාප මට්ටමින් අධීක්ෂණ මණ්ඩල පත් කළ යුතු ය. පළාත් මට්ටමේ අධීක්ෂණ මණ්ඩලය, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සභාපතීත්වයෙන් ද, කලාප මට්ටමේ අධීක්ෂණ මණ්ඩලය, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සභාපතීත්වයෙන් ද පත් කර ගත යුතු ය. වැඩසටහන් සම්බන්ධීකරණය පළාත් හා කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් විසින් සිදු කළ යුතු වේ.

සකස් කරන ලද වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත්, කලාප හා පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානවල දේශකවරුන් ද සම්බන්ධ කරගත යුතු වේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය උදෙසා තම අධ්‍යාපන ආයතනයට උචිත වන පරිදි සකස් කරගත් වැඩසටහන් අදාළ සතිය තුළ දී ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු ය.

<u>විශේෂයෙන් අවධානය යොමු කොට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සතිය තුළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති</u>

**(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය දැනට අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස්.පෙළ) සඳහා තෝරාගත් විෂයයක් වශයෙන් ක්‍රියාත්මක නොවන පාසල් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය නොවේ.)**

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සතිය පිළිබඳ ව පාසල / ආයතනය තුළ උචිත ක්‍රමෝපායයන් භාවිතා කරමින් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ ප්‍රදර්ශන සංවිධානය කිරීම (මෙහි ප්‍රධාන ප්‍රදර්ශනය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.)
3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් ස්ථාපිත "නැණසල" පරිගණක මධ්‍යස්ථාන සමග සම්බන්ධ වී සිසුන් සඳහා සුදුසු වැඩ සටහන් සංවිධානය කිරීම.
4. විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ දායකත්වයෙන් පාසල් මට්ටමේ / කලාප මට්ටමේ දේශන හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
5. පළාත් මට්ටමින් පවත්වන ලද "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෘදුකාංග නිපදවීමේ තරගයෙන්" ජයග්‍රහණය කරන ලද ගුරුවරුන් හා සිසුන් සඳහා කුසලතා හා සහතිකපත් ලබා දීමේ උත්සව අදාළ සතිය තුළ දී සංවිධානය කිරීම.
6. මෙතෙක් විවෘත නොකරන ලද "පාසල් පරිගණක විද්‍යාගාර" අදාළ සතිය තුළ දී සිසු අයිතියට පැවරීමට කටයුතු සංවිධානය කිරීම.

7. පරිගණක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රජාව තුළ පවතින අයහපත් ආකල්ප දුරු කිරීම සඳහා ප්‍රජාව වෙනුවෙන් දේශන, සම්මන්ත්‍රණ පැවැත්වීම.

8. පළාත් මට්ටමින් / කලාප මට්ටමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කඳවුරක් සංවිධානය කිරීම (ඇමුණුම 01 බලන්න). මේ සඳහා පළාත් / කලාප මට්ටමින් පරිගණක නොමැති පාසල්වලින් ගුරුවරුන් හා සිසු දරුවන් සුදුසු සංඛ්‍යාවක් තෝරා දින 3 / 4 ක නේවාසික / නේවාසික නොවන කඳවුරක් පරිගණක සම්පත් මධ්‍යස්ථාන (CRC) / පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන (PICT) වල පැවැත් වීම.

9. ගුරුවරුන් සහ සිසු දරුවන් විසින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඇසුරෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

10. පාසල්වල තොරතුරු සාක්ෂරතා කව පිහිටුවීම සංවිධානය කිරීම.

11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට සම්බන්ධ වූ විවිධාංග (නාට්‍ය, වැඩමුළු), පාසල් මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තරග හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවර්ධනය උදෙසා කටයුතු කරන ගුරුවරුන් හා දේශකවරුන් තෝරා සම්මාන ප්‍රදානය කිරීමට කටයුතු කිරීම ආදිය සිදුකිරීම.

එසේ ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලමක් ලෙස භාවිතය ජනප්‍රිය කිරීම සඳහා ආයතනයට උචිත ව සිදු කරනු ලබන ඕනෑ ම වැඩසටහනක් මේ සතිය තුළ දී ක්‍රියාත්මක කළ හැකි ය.

ආරියරත්න හේවගේ
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම 01

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කඳවුර

මෙය කලාප හෝ පළාත් මට්ටමින් සංවිධානය කළ හැකි ය. අදාළ කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථාන හෝ පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානවල දේශකවරුන් මාර්ගයෙන් වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි ය.

අවශ්‍ය අවස්ථාවල දී බාහිර සම්පත් පුද්ගලයින්ගේ සහභාගීත්වය ලබා ගැනීමට හැකි ය.

වැඩසටහනට, මූලික වශයෙන් පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඇතුළත් විය යුතු ය.

- දරුවන් තුළ පරිගණක භාවිතය පිළිබඳ රුචිකත්වය ඇති කිරීම
- මූලික පරිගණක කුසලතා
- පරිගණක ක්‍රීඩා
- කණ්ඩායම් ක්‍රීඩා
- Chatting, Conferencing, Internet, Email
- යහපත් ආකල්ප, නායකත්ව වර්ධන දේශන